ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

1996 අංක 9 දරන

තානාපති වරප්‍රසාද පනත

[සහතිකය සටහන් කළේ 1996 අප්‍රේල් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1996 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 2.06 යි.

1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත

[සහතිකය සටහන් කළේ 1996 අප්‍රේල් මස 9 වන දින]

එල්. ඩී.—ඕ. 9/95

තානාපති සම්බන්ධතා පිළිබඳ වියනා සම්මුතිය බලාත්මක කිරීම සඳහා ද; ඇතැම් ජාත්‍යන්තර සංවිධානවල නිලධරයන්ට, අනුයෝජිතයන්ට හා දේපළවලට මුක්ති සහ වරප්‍රසාද ප්‍රදානය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.

තානාපති සම්බන්ධතා පිළිබඳ වියනා සම්මුතිය 1961 අප්‍රේල් මස 18 වන දින වියනාහි දී සම්මත කරනු ලැබූ හෙයින් ද:

ශ්‍රී ලංකාව ඉහත කී සම්මුතියෙහි රාජ්‍ය පාර්ශ්වයක් වන හෙයින් ද:

ඉහත කී සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ වගකීම් ඉටුකිරීම සඳහා නෛතික විධිවිධාන සැලසීම අවශ්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කෙටි නාමය

2. (1) මේ පනතේ 3 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති (මෙහි මින් මතු "ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) තානාපති සම්බන්ධතා පිළිබඳ වියනා සම්මුතියේ ව්‍යවස්ථාව, ශ්‍රී ලංකාවෙහි නීතියෙහි ලා බලාත්මක විය යුතු අතර, මේ වගන්තියේ පසුව දැක්වෙන විධිවිධානවලට අනුකූලව තේරුම් ගත යුතු ය.

තානාපති සම්බන්ධතා පිළිබඳ වියනා සම්මුතිය අදාළ කිරීම.

(2) එම ව්‍යවස්ථාවල—

"භාරගන්නා රාජ්‍යයේ අනුයෝජිතයෝ" යන්නට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු ද, යම් නීතියක් යටතේ යම් පරිශ්‍රයකට ඇතුළුවීමේ බලය ක්‍රියාත්මක කරන යම් තැනැත්තකු ද ඇතුළත් වේතැයි තේරුම් ගත යුතු ය;

"භාරගන්නා රාජ්‍යයේ පුරවැසියා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් අදහස් වේතැයි තේරුම් ගත යුතු ය.

(3) 32 වන ව්‍යවස්ථාවේ කාර්ය සඳහා, යම් රාජ්‍යයක දූත මණ්ඩලයේ ප්‍රධානියා විසින් හෝ තත් කාලයේ දී ඔහුගේ කාර්ය ඉටු කරන යම් තැනැත්තකු විසින් කරන ලද අත්හැරීමක්, එම රාජ්‍යය විසින් කරන ලද අත්හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) 35, 36 සහ 40 වන ව්‍යවස්ථා මගින්, ප්‍රදානය කළ යුතු යයි නියමිත යම් වරප්‍රසාදයක් හෝ මුක්ති ප්‍රදානය කෙරෙන ලෙස, එම ව්‍යවස්ථා තේරුම් ගත යුතු ය.

(5) භාරගන්නා රාජ්‍යය විසින් යම් වරප්‍රසාද හා මුක්ති පිළිගනු ලබන ප්‍රමාණය පිළිබඳව සහ භාරගන්නා රාජ්‍යය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි අතිරේක වරප්‍රසාද හා මුක්ති පිළිබඳව 37 වන සහ

38 වන ව්‍යවස්ථාවල ඇති සඳහන් කිරීම්, පිළිවෙළින්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි වරප්‍රසාද හා මුක්ති පිළිබඳව සහ එසේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් අතිරේක වරප්‍රසාද සහ මුක්ති පිළිබඳව කළ සඳහන් කිරීම් ලෙස තේරුම් ගනු ලැබිය යුතු ය.

වරප්‍රසාද හා මුක්ති සීමා කිරීම

3. යම් බාහිර රාජ්‍යයක ඇති ශ්‍රී ලංකා දූත මණ්ඩලයකට හෝ එම දූත මණ්ඩලයට සම්බන්ධ තැනැත්තන්ට ලබා දී ඇති වරප්‍රසාද සහ මුක්ති, එම දූත මණ්ඩලයට හෝ එම දූත මණ්ඩලයට සම්බන්ධ තැනැත්තන්ට මේ පනත මගින් පිරිනමා ඇති වරප්‍රසාදවලට සහ මුක්තිවලට වඩා අඩු බව අමාත්‍යවරයාට පෙනී යන්නේ නම්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එම නියමයෙහි නිශ්චිතව දක්වනු ලබන මේ පනතේ විධිවිධාන, එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන දිනයක සිට, එම රාජ්‍යයේ දූත මණ්ඩලයට හෝ එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන එම රාජ්‍යයේ දූත මණ්ඩල සාමාජික ගණවලට අදාළ වීම නතර විය යුතු බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

මේ පනතේ විධිවිධාන ඇතැම් ජාත්‍යන්තර සංවිධානවලට ව්‍යාප්ත කිරීම.

4. (1) යම් අන්තර් ආණ්ඩු සංවිධානයක හෝ ජාත්‍යන්තර සංවිධානයක නිලධරයන්ට, අනුයෝජිතයන්ට හෝ දේපළවලට යම් මුක්ති සහ වරප්‍රසාද ප්‍රදානය කිරීම සඳහා විධිවිධාන සලස්වන්නා වූ ගිවිසුමක් ශ්‍රී ලංකා ආණ්ඩුව එම අන්තර් ආණ්ඩුව හෝ ජාත්‍යන්තර සංවිධානය සමඟ ඇති කරගෙන තිබෙන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සහ එම ගිවිසුමේ නියමයන් බලාත්මක කිරීමට අවශ්‍යවන ප්‍රමාණයට, එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන මේ පනතේ විධිවිධාන එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන ප්‍රමාණයට එම නියමයේ නිශ්චිතව දක්වනු ලබන එම සංවිධානයේ නිලධරයන්ට, අනුයෝජිතයන්ට සහ දේපළවලට අදාළ විය යුතු බව ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. එම නියමය කිරීමෙන් පසු එහි සඳහන් මේ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, එහි සඳහන් එම සංවිධානයේ නිලධරයන්ට, අනුයෝජිතයන්ට යන දේපළට අදාළ විය යුතු ය.

(2) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයකම එම නියමය කරනු ලබන්නේ යම් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් ද, එම ගිවිසුමේ නියමයන් ප්‍රකාශ කළ යුතු හෝ අන්තර්ගත කළ යුතු අතර, එම නියමය පළ කිරීමේ දින සිට හෝ එම නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන පසු දිනයක සිට එම නියමය බලාත්මක විය යුතු අතර, එම නියමය සාදනු ලැබුවේ යම් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් ද එම ගිවිසුම බලාත්මකව තිබෙන තාක් කල් පමණක් එම නියමය බලාත්මකව තිබිය යුතු ය.

නියමයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව.

5. (1) 2 වන, 3 වන හෝ 4 වන වගන්ති යටතේ සාදන ලද සෑම නියමයක්ම, එය පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක් අනුමත නොකරනු ලැබූ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු වුවද, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(ඉ) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක වීමෙන්, යම් නියමයක් පරිවර්ජිත්‍ර කරනු ලැබූ ලෙස සැලකෙන අවස්ථාවක දී, එම පරිවර්ජිත්‍ර වීම පිළිබඳව දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

6. යම් තැනැත්තකුට මේ පනත යටතේ වූ යම් වරප්‍රසාදයක් හෝ මුක්ති හිමිවේද නැද්ද යන ප්‍රශ්නයක් යම් නඩු කටයුතක දී පැන නැගුණු අවස්ථාවක දී, එම ප්‍රශ්නයට අදාළ සිද්ධි ප්‍රකාශ කරමින් විදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සන සහිත සහතිකයක් සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර එය එහි ප්‍රකාශිත සිද්ධි සම්බන්ධයෙන් අවසානාත්මක සාක්ෂිය විය යුතු ය. සාක්ෂි.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

[2 වන වගන්තිය]

උපලේඛනය

ශ්‍රී ලංකාවෙහි නීතියෙහි ලා බලාත්මක වන වියනා සම්මුතියේ ව්‍යවස්ථා

1 වන ව්‍යවස්ථාව

වර්තමාන සම්මුතියේ කාර්ය සඳහා, පහත දැක්වෙන යෙදුම්වල අර්ථ ඒ යෙදුම්වලට මෙහි පහත දී ඇති අර්ථ විය යුතු ය:

(අ) "දූත මණ්ඩලයේ ප්‍රධානයා" යනු යවන රාජ්‍යය විසින් ඒ ධුරයේ ක්‍රියා කිරීමේ කාර්යය නියම කොට ඇති තැනැත්තා වේ ;

(ආ) "දූත මණ්ඩලයේ සාමාජිකයෝ" දූත මණ්ඩලයේ ප්‍රධානයා සහ දූත පිරිසේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ වන්නාහ ;

(ඇ) "දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ" දූත මණ්ඩලයේ රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ ද පරිපාලන හා කාර්මික කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ ද එමෙන් ම සේවා කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ ද වන්නාහ.

(ඈ) "රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ" දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ රාජ්‍ය තාන්ත්‍රික තත්ත්වය දරන සාමාජිකයෝ වන්නාහ.

(ඉ) "තානාපති අනුයෝජිතයෙක්" දූත මණ්ඩලයේ ප්‍රධානයා හෝ දූත මණ්ඩලයේ තානාපති කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක් වේ.

(ඊ) "පරිපාලන හා කාර්මික කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ" දූත මණ්ඩලයේ පරිපාලන සහ කාර්මික සේවයේ නියුක්ත දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ වන්නාහ.

(උ) "සේවා කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ" දූත මණ්ඩලයේ ගෘහස්ථ සේවයේ යෙදී සිටින දූත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ වන්නාහ.

(ඌ) "පෞද්ගලික සේවකයෙක්" යනු දූත මණ්ඩලයේ සාමාජිකයකුගේ ගෘහස්ථ සේවයේ යෙදී සිටින්නා වූ ද, යවන රාජ්‍යයේ සේවා නියුක්තයකු නොවන්නා වූ ද තැනැත්තෙක් වේ.

(එ) "දූත මණ්ඩලයේ පරිශ්‍රය" යනු හිමිකම ඇතිව හෝ නැතිව දූත පිරිසේ ප්‍රධානයාගේ නිවස ඇතුළු දූත මණ්ඩලයේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ගොඩනැගිලිවල කොටස් සහ ඊට සම්බන්ධ භූමිය වේ.

22 වන ව්‍යවස්ථාව

1. දූත මණ්ඩලයේ පරිශ්‍රය අනුල්ලංඝනීය වන්නේ ය. දූත මණ්ඩලයේ ප්‍රධානයාගේ කැමැත්ත ඇතිව මිස, භාරගන්නා රාජ්‍යයේ අනුයෝජිතයන්ට එයට ඇතුළු විය නොහැකිය ය.

2. යම් බලෙන් ඇතුල්වීමකින් හෝ අලාභ සිදුකිරීමකින් දූත මණ්ඩලයේ පරිශ්‍රය ආරක්ෂා කිරීම සඳහා ද දූත මණ්ඩලයේ සාමය කඩ කිරීමක් හෝ දූත මණ්ඩලයේ ගෞරවයට හානි කිරීමක් වැළැක්වීම සඳහා උචිත සියලු පියවර ගැනීම භාරගන්නා රාජ්‍යයේ විශේෂ යුතුකම වේ.

3. දූත මණ්ඩලයේ පරිශ්‍රය ද, එහි බඩු බාහිරාදිය ද එහි ඇති වෙනත් දේපළ ද දූත මණ්ඩලයේ වාහන ද සෝදිසි කරනු ලැබීමෙන්, අධිග්‍රහණය කරනු ලැබීමෙන්, තහනම් කරනු ලැබීමෙන් හෝ ඇප්කිසි කරනු ලැබීමෙන් නිදහස් විය යුතු ය.

23 වන ව්‍යවස්ථාව

1. දූත මණ්ඩලයේ පරිශ්‍රය දූත මණ්ඩලයට අයත් වුව ද නැතහොත් එය බදුගෙන තිබුණද එම පරිශ්‍රය සම්බන්ධයෙන් සපයන ලද යම් විශේෂිත සේවාවක් සඳහා වූ ගෙවීමක් හැර, ගෙවිය යුතු සියලු ජාතික, ප්‍රාදේශීය හෝ නාගරික අයකිරීම්වලින් සහ බදුවලින් යවන රාජ්‍ය සහ දූත මණ්ඩල ප්‍රධානයා නිදහස් විය යුතු ය.

2. මේ ව්‍යවස්ථාවේ සඳහන් බදු නිදහස යවන රාජ්‍යය සමග හෝ දූත මණ්ඩලයේ ප්‍රධානයා සමග ගිවිසුම්වලට ඇතුළත් වන්නා වූ තැනැත්තන් විසින්, භාර ගන්නා රාජ්‍යයේ නීතිය යටතේ ගෙවිය යුතු ගෙවීම් සහ බදු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

24 වන ව්‍යවස්ථාව

දූත මණ්ඩලයේ ලේඛනාගාරය සහ ලේඛන කවර වේලාවක දී ද කවර ස්ථානයක දී ද අනුල්ලංඝනීය විය යුතු ය.

27 වන ව්‍යවස්ථාව

1. සියලු නිල කාර්ය සඳහා, දූත මණ්ඩල විසින් කරනු ලබන සන්නිවේදන නිදහසේ කිරීමට භාරගන්නා රාජ්‍යය විසින් අවසරය හා ආරක්ෂාව දෙනු ලැබිය යුතු ය. ආණ්ඩුව සමගත් කවර හෝ ස්ථානයක පිහිටි යවන රාජ්‍යයේ වෙනත් දූත මණ්ඩල හා කොන්සල් කාර්යාල සමගත් පණිවුඩ හුවමාරු කර ගැනීමේ දී, දූත මණ්ඩල විසින් තානාපති පණිවුඩකරුවන් සහ සංකේත හෝ රහස් ලිපි ක්‍රම ඇතුළු සියලු යෝග්‍ය ක්‍රම යොදා ගනු ලැබිය හැකි ය. එසේ වුව ද දූත මණ්ඩල විසින් ගුවන් විදුලි සම්ප්‍රේෂණ යන්ත්‍රයක් ස්ථාපනය කර භාවිත කිරීම, භාර ගන්නා රාජ්‍යයේ කැමැත්ත ඇතිව පමණක් කළ හැකි ය.

2. දූත මණ්ඩලයේ නිල ලිපි ගනුදෙනු අනුල්ලංඝනීය විය යුතු ය. නිල ලිපි ගනුදෙනු යන්නෙන් දූත මණ්ඩලයට හා එහි කර්තව්‍යවලට අදාළ සියලු ලිපි ගනුදෙනු අදහස් වේ.

3. තානාපති මල්ල විවෘත කිරීම හෝ රඳවා ගැනීම නොකළ යුතු ය.

4. තානාපති මල්ලට අයත් ඇසුරුම් ඒවායේ ස්වභාවය පිළිබඳ පැහැදිලිව පෙනෙන බාහිර ලකුණු සහිතව තිබිය යුතු අතර, තානාපති ලේඛන සහ නිල ප්‍රයෝජනය සඳහා ගැනීමට අදහස් කෙරෙන භාණ්ඩ පමණක් ඒවා තුළ තිබිය හැකි ය.

5. තානාපති පණිවුඩකරුට ඔහුගේ තත්වය සහ තානාපති මල්ල සංයුක්ත වන ඇසුරුම් සංඛ්‍යාව දැක්වෙන නිල ලේඛනයක් සපයා තිබිය යුතු අතර, ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී භාර ගන්නා රාජ්‍ය විසින් ඔහු ආරක්ෂා කරනු ලැබිය යුතු ය. ඔහුගේ පෞද්ගලිකත්වය අනුල්ලංඝනීය වන අතර, කිසිම ආකාරයක අත්අඩංගුවට ගැනීමකට හෝ රඳවා ගැනීමකට ඔහු යටත් නොවිය යුතු ය.

6. යවන රාජ්‍යයේ හෝ දූත මණ්ඩල විසින් තානාපති පණිවුඩකරුවන් යථා යෝග්‍ය පරිදි නම් කරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවල දී මේ ව්‍යවස්ථාවේ 5 වන ඡේදයේ විධිවිධාන ද අදාළ විය යුතු වුව ද එහි සඳහන් මුක්ති අදාළවීම එවැනි තානාපති පණිවුඩකරුවකු විසින් තමාගේ භාරයේ ඇති තානාපති මල්ල එය ලැබිය යුතු තැනැත්තාට භාරදීමෙන් පසු නතර විය යුතු ය.

7. තානාපති මල්ලක්, යම් අවසරලත් ගුවන් තොටුපළකට බැස්සවීමට නියමිත වාණිජ ගුවන් යානයක කපිතාන්වරයාට භාර දෙනු ලැබිය හැකිය. මල්ල සංයුක්ත වන ඇසුරුම් සංඛ්‍යාව සඳහන් නිල ලේඛනයක් ඔහුට ලබා දිය යුතු නමුත් ඔහු තානාපති පණිවුඩකරුවකු ලෙස සලකනු නොලැබිය යුතු ය. තානාපති මල්ලේ සන්තකය ගුවන් යානයේ කපිතාන්වරයාගෙන් කෙළින්ම හා නිදහසේ ලබා ගැනීම පිණිස දූත මණ්ඩලය විසින් එහි සාමාජිකයන්ගෙන් කෙනෙක් යවනු ලැබිය හැකි ය.

28 වන වාවස්ථාව

දූත මණ්ඩල විසින් නිල කාර්යවල දී අය කරනු ලබන ගාස්තු හා දඩකිරීම්, සියලු ගෙවීම් හා බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.

29 වන වාවස්ථාව

තානාපති අනුයෝජිතයකුගේ පෞද්ගලිකත්වය අතුල්ලංඝනීය විය යුතු ය. ඔහු කිසිම ආකාරයක සිරභාරයට ගැනීමකට හෝ අත්අඩංගුවට ගැනීමකට යටත් නොවිය යුතුය. භාරගන්නා රාජ්‍යය විසින් ඔහුට නිසි ගෞරවයෙන් යුක්තව සැලකිය යුතු අතර, ඔහුගේ ශරීරයට, නිදහසට හෝ ගෞරවයට යම් පහරදීමක් සිදුවීම වැළැක්වීම පිණිස සියලු උචිත පියවර ගත යුතු ය.

30 වන වාවස්ථාව

1. තානාපති අනුයෝජිතයකුගේ පෞද්ගලික නිවස ද, දූත මණ්ඩලයේ පරිශ්‍රය මෙන්ම සමාන අතුල්ලංඝනීය භාවයක් හා ආරක්ෂාවක් භුක්ති විඳිය යුතු ය.

2. ඔහුගේ ලියකියවිලි, ලිපි ගනුදෙනු සහ, 31 වන වාවස්ථාවේ 3 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර ඔහුගේ දේපළ එසේ ම අතුල්ලංඝනීය භාවය භුක්ති විඳිය යුතු ය.

31 වන වාවස්ථාව

1. තානාපති අනුයෝජිතයකු භාරගන්නා රාජ්‍යයේ අපරාධ අධිකරණ බලයෙන් මුක්තිය ලැබිය යුතු ය. තව ද පහත සඳහන් අවස්ථාවල දී හැර, භාරගන්නා රාජ්‍යයේ සිවිල් හා පරිපාලන අධිකරණ බලයෙන් ද මුක්තිය ඔහුට භුක්ති විඳිය යුතු ය;—

(අ) දූත මණ්ඩලයේ කාර්ය සඳහා, යවන රාජ්‍යය වෙනුවෙන් ඔහු යම් පෞද්ගලික නිශ්චල දේපළක් දරන්නේ නම් හැර, භාරගන්නා රාජ්‍යයේ දේශය තුළ පිහිටි පෞද්ගලික යම් නිශ්චල දේපළකට අදාළ යම් වාස්තව නඩුවක්;

(ආ) යවන රාජ්‍යය වෙනුවෙන් නොව පෞද්ගලික තැනැත්තකු වශයෙන් තානාපති අනුයෝජිතයා, පොල්මකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු, උරුමකරුවකු හෝ තෙස්තමේන්තු දායාද ලාභියකු වශයෙන් සම්බන්ධ වී ඇති, අනුප්‍රාප්තිය පිළිබඳ නඩුවක්;

(ඇ) තානාපති අනුයෝජිතයා සිය නිල කටයුතුවලට පිටස්තරව, භාරගන්නා රාජ්‍යයෙහි යෙදෙන්නා වූ යම් වෘත්තීය හෝ වාණිජ ක්‍රියාකාරකමකට අදාළ නඩුවක් ;

2. තානාපති අනුයෝජිතයකු සාක්ෂිකරුවකු ලෙස සාක්ෂි දීමට බැඳී නැත.

3. තානාපති අනුයෝජිතයකු සම්බන්ධයෙන් කිසිම ක්‍රියාත්මක කිරීමේ පියවරක් ගැනීම මේ වාවස්ථාවේ 1 වන ඡේදයේ (අ), (ආ) සහ (ඇ) උපඡේද යටතේ වූ අවස්ථාවල දී හැර එමෙන්ම එම තානාපති අනුයෝජිතයාගේ හෝ ඔහුගේ නිවසේ හෝ අතුල්ලංඝනීයභාවය කඩ නොවන පරිදි කළ හැකි නම් මිස, නොකළ යුතු ය.

4. තානාපති අනුයෝජිතයකු භාරගන්නා රාජ්‍යයේ අධිකරණ බලය සම්බන්ධයෙන් ලබන මුක්තිය හේතුකොට ගෙන, යවන රාජ්‍යයේ අධිකරණ බලයෙන් ඔහු නිදහස් නොකෙරේ.

32 වන ව්‍යවස්ථාව

1. තානාපති අනුයෝජිතයන්ට සහ 37 වන ව්‍යවස්ථාව යටතේ මුක්තිය ලබන පුද්ගලයන්ට ලැබෙන අධිකරණ බලයට එරෙහිව ඇති මුක්තිය යවන රාජ්‍යය විසින් අත්හරිනු ලැබිය හැකි ය.

2. එම අත්හැරීම සෑම අවස්ථාවක දී ම ප්‍රකාශිත අත්හැරීමක් විය යුතු ය.

3. තානාපති අනුයෝජිතයකු විසින් හෝ 37 වන වගන්තිය යටතේ අධිකරණ බල මුක්තිය ලබන තැනැත්තකු විසින් හෝ නඩු කටයුතු ආරම්භ කිරීම මගින් ප්‍රධාන හිමිකම් පෑමට කෙළින්ම සම්බන්ධ යම් ප්‍රතිවිරුද්ධ හිමිකම් පෑමක් සම්බන්ධයෙන්, අධිකරණ බල මුක්තිය ආධාර කර ගැනීමෙන් ඔහු වළක්වනු ලැබිය යුතු ය.

4. සිවිල් හෝ පරිපාලන නඩු කටයුතු සම්බන්ධයෙන් අධිකරණ බල මුක්තිය අත්හැරීමෙන් නඩු තීන්දුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ මුක්තිය අත්හැරීමක් ව්‍යංජිත වන බවට නිරණය නොකළ යුතු ය. නඩු තීන්දුව ක්‍රියාත්මක කිරීමෙන් මුක්තිය අත්හැරීම සඳහා වෙනම අත්හැරීමක් අවශ්‍ය වන්නේ ය.

33 වන ව්‍යවස්ථාව

1. මෙම ව්‍යවස්ථාවේ 3 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, තානාපති අනුයෝජිතයකු යවන රාජ්‍යයට ඉටු කරනලද සේවා සම්බන්ධයෙන් භාරගන්නා රාජ්‍යයේ බලාත්මකව පවත්නා සමාජ ආරක්ෂණ විධිවිධානවලින් නිදහස් විය යුතු ය.

2. මෙම ව්‍යවස්ථාවේ 1 ඡේදයේ විධිවිධාන සලස්වා ඇති නිදහස් කිරීම, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව තානාපති අනුයෝජිතයකුගේ සේවයෙහි පමණක් නියුක්තව සිටින පෞද්ගලික සේවකයන්ට ද අදාළ විය යුතු ය:—

(අ) ඔවුන් භාර ගන්නා රාජ්‍යයේ පුරවැසියන් හෝ ස්ථිර පදිංචි කරුවන් නොවීම ; සහ

(ආ) ඔවුන් යවන රාජ්‍යයේ හෝ තුන්වන රාජ්‍යයක බලාත්මකව පවත්නා සමාජ ආරක්ෂණ විධිවිධාන වලින් ආවරණය වී සිටීම.

3. මෙම ව්‍යවස්ථාවේ 2 වන ඡේදය මගින් විධිවිධාන සලස්වා ඇති නිදහස් කිරීම අදාළ නොවන තැනැත්තන් සේවයේ නියුක්ත කරන තානාපති අනුයෝජිතයකු විසින්, භාරගන්නා රාජ්‍යයේ සමාජ ආරක්ෂණ විධිවිධාන මගින් සේවා යෝජකයන් කෙරෙහි පනවා ඇති වගකීම් ඉටු කරනු ලැබිය යුතු ය.

4. භාරගන්නා රාජ්‍යයේ සමාජ ආරක්ෂණ ක්‍රමයට ස්වෙච්ඡාවෙන් සහභාගීවීම එම රාජ්‍යය මගින් අවසර දෙනු ලැබේ නම්, මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය හා 2 වන ඡේදය මගින් විධිවිධාන සලස්වා ඇති නිදහස් කිරීම මගින් එසේ සහභාගිවීම වළක්වනු නොලැබිය යුතු ය.

5. මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන කලින් ඇති කර ගත් ද්වි පාර්ශ්වික හෝ බහු පාර්ශ්වික සමාජ ආරක්ෂණ ගිවිසුම් කෙරෙහි බල නොපෑ යුතු අතර, අනාගතයේ දී එවැනි ගිවිසුම් ඇති කර ගැනීම එමගින් වළක්වනු නොලැබිය යුතු ය.

34 වන ව්‍යවස්ථාව

පහත සඳහන් අවස්ථාවල දී හැර, පෞද්ගලික හෝ දේපළ සම්බන්ධයෙන් වන, සියලු ජාතික, ප්‍රාදේශීය හෝ නාගරික අයකිරීම් වලින් හා බදුවලින් තානාපති අනුයෝජිතයකු නිදහස විය යුතු ය:—

(අ) භාණ්ඩ හෝ සේවා මිලට සාමාන්‍යයෙන් ඇතුළත් කරනු ලබන වර්ගයේ වක්‍ර බදු ;

(ආ) දූත මණ්ඩලයේ කාර්ය සඳහා, යවන රාජ්‍යය වෙනුවෙන් ඔහු විසින් දරනු ලැබේ නම් මිස, භාර ගන්නා රාජ්‍යයේ දේශය තුළ පිහිටි පෞද්ගලික නිශ්චල දේපළ පිළිබඳ සියලු අයකිරීම් හා බදු ;

(ඇ) 39 වන ව්‍යවස්ථාවේ 4 වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, භාරගන්නා රාජ්‍යය විසින් පනවනු ලබන බූදල් බදු, අනුප්‍රාප්ති බදු හෝ උරුමවීම පිළිබඳ බදු ;

(ඈ) යම් පෞද්ගලික ආදායම්වල ප්‍රභවය භාර ගන්නා රාජ්‍යයෙහි වේ ද ඒ ආදායම් සම්බන්ධයෙන් වූ අයකිරීම් හා බදු සහ භාරගන්නා රාජ්‍යයෙහි වෙළෙඳ ව්‍යාපාරවල යොදවා ඇති ආයෝජන මත වූ ප්‍රාග්ධන බදු ;

(ඉ) සපයන ලද යම් විශේෂිත සේවා සඳහා අයකරනු ලබන ගාස්තු ;

(ඊ) 23 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන ලියාපදිංචි කිරීමේ ගාස්තු, අධිකරණ හෝ වාර්තා ගාස්තු, උකස් අයකිරීම් හා මුද්දර ගාස්තු.

35 වන ව්‍යවස්ථාව

භාර ගන්නා රාජ්‍යය විසින්, තානාපති අනුයෝජිතයන් සියලු පෞද්ගලික සේවා වලින් ද සාධාරණ ආකාරයක හෝ සියලු රාජ්‍ය සේවා වලින් ද අධිග්‍රහණය කිරීම, යුධ කටයුතු සඳහා දායකවීම් සහ යුද්ධ හමුදාවට නවාතැන්දීම හා සම්බන්ධ කටයුතු වැනි යුද්ධමය බැඳීම් වලින් ද නිදහස් කරනු ලැබිය යුතු ය.

36 වන ව්‍යවස්ථාව

1. භාරගන්නා රාජ්‍යය විසින්, පනවනු ලබන නීති සහ නියෝගවලට අනුකූලව—

(අ) දූත මණ්ඩලයේ නිල ප්‍රයෝජනය සඳහා වන භාණ්ඩ ;

(ආ) තානාපති අනුයෝජිතයකුගේ සේවක මණ්ඩලය සඳහා අදහස් කෙරෙන භාණ්ඩ ඇතුළුව එම අනුයෝජිතයාගේ හෝ ඔහුගේ නිවසේම සිටින ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා වන භාණ්ඩ ;

රාජ්‍යය තුළට ගෙන ඒම සහ ඒවා සම්බන්ධයෙන් ගබඩා කුලී, කරත්ත කුලී සහ ඒ හා සමාන සේවා සඳහා වන අයකිරීම් හැර, සියලු රේගු බදු වලින් ද වෙනත් බදු වලින් ද අදාළ ගාස්තු වලින් ද නිදහස් කරනු ලැබිය යුතු ය.

2. තානාපති අනුයෝජිතයකුගේ පෞද්ගලික ගමන් මලු, මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් නිදහස්කිරීම් වලින් අවාරණය නොවන භාණ්ඩ හෝ භාරගන්නා රාජ්‍යයේ නීතිය මගින් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම තහනම් කරන ලද භාණ්ඩ හෝ එම රාජ්‍යයේ රෝග නිවාරණ නියෝග මගින් පාලනය කරනු ලබන භාණ්ඩ ඇති බවට පූර්ව නිගමනය කිරීම සඳහා ප්‍රබල හේතු ඇත්නම් මිස, පරීක්ෂා කරනු ලැබීමෙන් නිදහස් විය යුතු ය. එවැනි පරීක්ෂාවක් එම තානාපති අනුයෝජිතයා ඉදිරිපිට දී හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා ඉදිරිපිට දී පමණක් කළ යුතු ය.

37 වන ව්‍යවස්ථාව

1. තානාපති අනුයෝජිතයකුගේ නිවාසයෙහිම සිටින එම අනුයෝජිතයාගේ පවුලේ සාමාජිකයන්, භාරගන්නා රාජ්‍යයේ පුරවැසියන් නොවේනම් 29 වන ව්‍යවස්ථාවේ සිට 36 වන ව්‍යවස්ථාව දක්වා ව්‍යවස්ථාවල සඳහන් වරප්‍රසාද සහ මුක්ති ලැබිය යුතු ය.

2. දූත මණ්ඩලයේ පරිපාලන හා කාර්මික කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් ද, පිළිවෙලින් ඔවුන්ගේ නිවාසවලම සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ද, භාරගන්නා රාජ්‍යයේ පුරවැසියන් හෝ ස්ථිර පදිංචිකරුවන් නොවේනම් 29 වන ව්‍යවස්ථාවේ සිට 35 වන ව්‍යවස්ථාව දක්වා ව්‍යවස්ථාවල සඳහන් වරප්‍රසාද හා මුක්ති ලැබිය යුතුය :

එසේ වුව ද, 31 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් පරිදි වූ භාරගන්නා රාජ්‍යයේ සිවිල් හා පරිපාලන අධිකරණ බලයෙන් මුක්තිය ඔවුන්ගේ නිල කටයුතුවලට පිටතින් කරනු ලබන ක්‍රියාවලට ව්‍යාප්ත නොවිය යුතු ය. එසේම ඔවුන් පළමුවරට එක්වී ඒ මෙදී ආනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් 36 වන ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් වරප්‍රසාද ඔවුන්ට ලැබිය යුතු ය

3. භාරගන්නා රාජ්‍යයේ පුරවැසියන් හෝ ස්ථිර පදිංචිකරුවන් නොවන්නා වූ දූත මණ්ඩලයේ සේවා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් තමන්ගේ කාර්ය ඉටු කරන අතරතුර දී කරන ක්‍රියා සම්බන්ධයෙන් මුක්තිය ලැබිය යුතු අතර, සිය සේවා නියුක්තිය හේතු කොටගෙන ඔවුන්ට ලැබෙන පාරිශ්‍රමිකය අය කිරීම හා බදු වලින් නිදහස් විය යුතු ය. තවද 33 වන ව්‍යවස්ථාවේ අන්තර්ගත නිදහස් කිරීම ඔවුන්ට ලැබිය යුතු ය.

4. දූත මණ්ඩලයේ සාමාජිකයන්ගේ පෞද්ගලික සේවකයන් භාරගන්නා රාජ්‍යයේ පුරවැසියන් හෝ ස්ථිර පදිංචිකරුවන් නොවේ නම්, ඔවුන්ගේ සේවා නියුක්තිය හේතු කොටගෙන ඔවුන්ට ලැබෙන පාරිශ්‍රමිකය, අය කිරීම හා බදු වලින් නිදහස් විය යුතු ය. වෙනත් කරුණු සම්බන්ධයෙන් භාරගන්නා රාජ්‍යය විසින් පිළිගනු ලබන ප්‍රමාණයට පමණ වරප්‍රසාද හා මුක්ති ඔවුන්ට ලැබිය හැකි ය. එසේ වුව ද, දූත මණ්ඩලයේ කර්තව්‍ය කිරීම කෙරෙහි අයථා මැදිහත් වීමක් නොවන ආකාරයට ඒ තැනැත්තන් සම්බන්ධයෙහි භාරගන්නා රාජ්‍යයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

38 වන ව්‍යවස්ථාව

1. භාරගන්නා රාජ්‍යය විසින් ප්‍රදානය කරනු ලබන අතිරේක වරප්‍රසාද සහ මුක්ති හැර, එම රාජ්‍යයේ පුරවැසියකු හෝ ස්ථිර පදිංචිකරුවකු වන තානාපති අනුයෝජිතයකු සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී කරනු ලබන නිල ක්‍රියා සම්බන්ධයෙන් පමණක් අධිකරණ බල මුක්තිය හා අනුල්ලංඝනීයභාවය ලැබිය යුතු ය.

2. භාරගන්නා රාජ්‍යයේ පුරවැසියන් හෝ ස්ථිර පදිංචිකරුවන් වන, දූත පිරිසේ කාර්ය මණ්ඩලයේ වෙනත් සමාජිකයන් සහ පෞද්ගලික සේවකයන්, භාරගන්නා රාජ්‍යය පිළිගනු ලබන ප්‍රමාණයට පමණක් වරප්‍රසාද සහ මුක්ති ලැබිය යුතු ය. එසේ වුව ද, දූත මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි අයථා මැදිහත් වීමක් නොවන ආකාරයට එම තැනැත්තන් සම්බන්ධයෙන් භාරගන්නා රාජ්‍යයේ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

39 වන ව්‍යවස්ථාව

1. තානාපති වරප්‍රසාද සහ මුක්ති හිමි වන සෑම තැනැත්තකුම සිය ධුරය භාර ගැනීමට යාමේ දී, භාරගන්නා රාජ්‍යයේ දේශයට ඇතුළු වූ වහාම හෝ ඔහු එවකටත් දේශයට ඇතුළු වී ඇත්නම්, ඔහුගේ පත්වීම පිළිබඳව විදේශ අමාත්‍යාංශයට හෝ එකඟත්වයකට පැමිණ ඇති වෙනත් අමාත්‍යාංශයකට හෝ දනුම් දෙනු ලබන මොහොතේ සිට, එම වරප්‍රසාද හා මුක්ති ලැබිය යුතු ය.

2. වරප්‍රසාද හා මුක්ති ලබන තැනැත්තකුගේ කර්තව්‍ය අවසන් වූ විට, ඒ තැනැත්තා රටින් පිටවන අවස්ථාවේ දී හෝ, එසේ කිරීම සඳහා සාධාරණ කාලයක් ගතවීමෙන් පසු හෝ ඒ වරප්‍රසාද හා මුක්ති සාමාන්‍යයෙන් අවසන් විය යුතු ය. එහෙත් එසේ නමුත් ඒ වරප්‍රසාද හා මුක්ති අවි ගැටුම් ඇති අවස්ථාවක දී වුවද බලපැවැත්විය යුතු ය. එසේ වුවද, දූත මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සිය කර්තව්‍ය ඉටු කිරීමේ දී එවැනි තැනැත්තකු විසින් කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන්, මුක්තිය දිගටම බලපැවැත්විය යුතු ය.

3. දූත මණ්ඩලයේ සාමාජිකයකු මිය යෑමේ දී, ඔහුගේ පවුලේ සාමාජිකයන්ට හිමි වරප්‍රසාද හා මුක්ති රටින් පිටවීම සඳහා වූ සාධාරණ කාලයක් ගතවනතුරු දිගටම ඔවුන්ට ලැබිය යුතු ය.

4. භාරගන්නා රාජ්‍යයේ පුරවැසියකු හෝ ස්ථිර පදිංචිකරුවකු නොවන, දූත මණ්ඩලයේ සාමාජිකයකු හෝ ඔහුගේ නිවසේ සිටින ඔහුගේ පවුලේ සාමාජිකයකු හෝ මිය යෑමේ දී, ඔහු මිය යන විට අපනයනය කිරීම තහනම් කරනු ලැබූ එරට තුළ දී අත්කරගත් දේපළක් හැර මියගිය තැනැත්තාට වංචල දේපළ ගෙනයාම සඳහා භාරගන්නා රාජ්‍යය විසින් අවසර දෙනු ලැබිය යුතු ය. මියගිය තැනැත්තා දූත මණ්ඩලයේ සාමාජිකයකුව සිටීම නිසා හෝ දූත මණ්ඩලයේ සාමාජිකයකුගේ පවුලේ සාමාජිකයකුව සිටීම නිසා පමණක් භාරගන්නා රාජ්‍යයේ තැබූ වංචල දේපළ මත, මුදල් බදු, අනුප්‍රාප්ති බදු සහ උරුමවීමේ බදු අයකරනු නොලැබිය යුතු ය.

40 වන ව්‍යවස්ථාව

1. තානාපති අනුයෝජිතයකු, තම ධුරය භාරගැනීමට යාමේ දී හෝ තම ධුරයේ කටයුතු කිරීමට ආපසු යාමේ දී හෝ තම රටට ආපසු යාමේ දී තමාට, ගමන් බලපත්‍ර වීසා බලපත්‍රයක් අවශ්‍ය වී එවැනි වීසා බලපත්‍රයක් ලබා දී ඇති තුන්වන රාජ්‍යයක් පසුකර යන්නේ නම් හෝ එම තුන්වන රාජ්‍යයේ දේශය තුළ සිටින්නේ නම් ඔහුගේ ගමන හෝ ආපසු ගමන සඳහා අවශ්‍ය අනුල්ලංඝනීය භාවය සහ වෙනත් මුක්ති ද එම තුන්වන රාජ්‍යය විසින් ඔහුට ලබාදිය යුතු ය. තානාපති අනුයෝජිතයා සමඟ ගමන් කරන හෝ ඔහු හා එක්වීම පිණිස හෝ ඔවුන්ගේ රටට ආපසු යාමට වෙන්ව ගමන් කරන හෝ වරප්‍රසාද හා මුක්ති ලබන්නා වූ එම තානාපති අනුයෝජිතයාගේ යම් පවුලේ සාමාජිකයන් සම්බන්ධයෙන් ද ඉහත කී විධි විධානය අදාළ විය යුතු ය.

2. මේ ව්‍යවස්ථාවේ 1 වන ඡේදයේ සඳහන් අවස්ථානුගත කරුණුවලට සමාන අවස්ථානුගත කරුණුවල දී, දූත මණ්ඩලයක පරිපාලන කාර්මික හෝ සේවා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හෝ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් තුන්වන රාජ්‍යවල දේශ හරහා ගමන් කරන විට එම ගමන් කිරීමට ඒ තුන්වන රාජ්‍ය විසින් බාධා නොකළ යුතු ය.

3. සංකේත හෝ රහස් ලිපි ක්‍රම වලින් යවනු ලබන පණිවුඩ ද ඇතුළු, මාර්ගස්ථ නිල ලිපි ගනුදෙනුවලට සහ වෙනත් නිල සන්නිවේදනවලට තුන්වන රාජ්‍යයන් විසින් භාර ගන්නා රාජ්‍යය විසින් සලසනු ලබන නිදහස සහ ආරක්ෂාවම සලසනු ලැබිය යුතු ය. ගමන් බලපත්‍ර වීසා බලපත්‍රයක් අවශ්‍ය වී එවැනි බලපත්‍රයක් සපයනු ලැබූ තානාපති පණිවුඩකරුවන්ට ද මාර්ගස්ථ තානාපති මලුවලට ද භාරගන්නා රාජ්‍යය විසින් දිය යුතු අනුල්ලංඝනීය භාවය හා ආරක්ෂාවම තුන්වන රාජ්‍ය මඟින් ද ලබා දිය යුතු ය.

4. මේ ව්‍යවස්ථාවේ 1 වන, 2 වන සහ 3 වන ඡේද යටතේ තුන්වන රාජ්‍යවල වගකීම්, අනපේක්ෂිත හා මැඩලිය නොහැකි හේතු නිසා තුන්වන රාජ්‍යයක දේශය තුළ සිටීමට හෝ සිටීමට සිදුවූ, පිළිවෙලින් එම ඡේදවල සඳහන්, තැනැත්තන්ට ද, නිල සන්නිවේදනවලට සහ තානාපති මලුවලට ද අදාළ විය යුතු ය.